## නබි මුහම්මද් ρ තුමන්ගේ ජන්මදිනය (මව්ලිද්) සැමරීම
## බිහිවීම, ව්‍යාප්තිය, ආගමික තීන්දුව.

නබි ρ තුමන්ව ඇළුම්කිරීම විශ්වාසයේ මූලික කරුණුවලින් එකක්වේ. එතුමන්ව පැහැරහැරීම ඊමානය (විශ්වාසය) බිඳීමේ ක්‍රියාවකි.
මෙම කරුණ පහත සඳහන් අල්කුර්ආන් වැකිය හා හදීසය සනාථකරන්නේය.
විශ්වාසවන්තයින්ට තම ආත්මාවන්ට වඩා ප්‍රමුකත්වය ලබන්නේ මෙම නබි (මුහම්මද්) තුමන්ය (අල්අහ්සාබ්:6)
තම පියා, දරුවාහා අන් සෑම දෙනාට වඩා මාව ප්‍රිය කරනතෙක් ඔබලාගෙන් කවරෙකුහෝ විශ්වාසවන්තයා විය නොහැක. (බුහාරි ග්‍රන්ථය:15, මුස්ලිම් ග්‍රන්ථය69)

නබි මුහම්මද් ρ තුමන්කෙරෙහි සම්පූර්ණ සෙනෙහස හා ගෞරවය දැක්වීම යනු එතුමන්ව අනුගමනය කිරීම හා එතුමන්ගේ සුන්නාහෙවත් ජීවිතාදර්ශය තම ජීවිතයේ නගාසිතුවීමයි.
(නබිතුමනී) 'ඔබලා (අවංකවම) අල්ලාහ්ට ඇළුම් කරමින් සිටින්නෙනම්, මා අනුගමනය කරන්න. (එවිට) අල්ලාහ් ඔබලාට ඇළුම් කරයි. තවද ඔබලාගේ පාපයන් සදහා සමාවද දෙනු ඇත. අල්ලාහ් ක්ෂමාශීලි හා මහ දයාන්විතයි යනුවෙන් (ඔබ මිනිසුන්ට) පවසන්න (3:31)

**<u>නබි මුහම්මද් (සල්) තුමන්ට ඇළුම් කිරීම යන වාදයට මුවාව සිදුවන නොමනා ක්‍රියාවන්.</u>**

සූෆි වාදීන්, තරීකා බක්තිකයින්, සොහොන් සමාධි අසල වැඳවැටෙන්නන් නබි ρ තුමන්ට සෙනෙහස දක්වන්නැමු යන වාදය මුල්කරගෙන පහත සඳහන් ෂිර්ක් ක්‍රියාවන් හා බිද්අත් කාර්‍යන්ව පතුරුවාහැර ඇත්තෝය.

1. නබිතුමන්ගේ දීප්තියයි පළමු නිර්මාණය. 2. නබි මුහම්මද් ρ තුමන්ගේ පරිශුද්ධ ආත්මාව මිහිපිට සැරිසරයි.
3. අවිදියෙන් සියැසින් නබිතුමන්ව දිටිය හැක. 4. නබිතුමන් වෙත සෘජුව ප්‍රාර්ථනා කර අවශ්‍යතාවයන් පැතිය හැක.
5. නබි ρ තුමන්ගේ සොහොන්වල කරා වන්දනා යාත්‍රා කළහැක.
6. නබිතුමන්ගේ සොහොන් සමාධිය හෝ එය වටා ඇති තැන් බරකත් හෙවත් ආශිර්වාදය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් සිඹ, අත ගාගැනීම. 7. මව්ලිද් (නබිතුමන්ගේ ජන්මදිනය) සැමරීම.

**<u>මව්ලිද් යනු කුමක්ද?</u>**

මව්ලිද් (مولد) යන අරාබි පදයට, උපත, උපන්කාලය හෝ ස්ථානය යන තේරුම් ඇත. මෙය භාවිතයේ මව්ලූද් යනුවෙන් ව්‍යවහාරවේ එහෙයින් අල් මව්ලිද් අන් නබවි යන්නට නබි මුහම්මද් ρ තුමන්ගේ ජන්ම දිනය යන අර්ථයවේ.
මුහම්මද් නබි ρ තුමන්ගේ උපත සඳුදා දිනක සිදුවුනුබව මුස්ලිම් ග්‍රන්ථයේ හදීසයක සඳහන් වී ඇත (මුස්ලිම්:1162).
තවත් විශ්වාස වන්න ආරංචිමාර්ගයක නබි ρ තුමන් ඇත් වර්ෂයේ උපත ලදබව ප්‍රකාශවේ. ඉස්ලාමීය විද්වතුන්ගෙන් බහුතරයේ මතය එතුමන් **රබීඋනිල් අව්වල්** මාසයේ උපත ලදබවයි.
නබි තුමන්ගේ ඉතිහාස රචකයෙකුවන ඉබ්නු ඉස්හාක් පවසනවට අනුව එය සිදුවී ඇත්තේ මෙම මාසයේ 12වැනි දිනයයි. නමුත් දෙවැනි, දහවැනි දිනයන්හි නබි උපත සිදුවූ බවටද තවත් සමහරක් ඇරංචි මාර්ගවල සඳහන් වීඇත.
සමහරුන් වාර්ෂිකව විශේෂයෙන් **රබීඋනිල් අව්වල් මාසයේම** නබි ρ තුමන්ගේ ජන්ම දිනය සමරන්නෝය. තවද එය ආගමික වතාවක්යයිද. එසේ කිරීමෙන් කුසල් ලැබෙන්නේය යයිද විශ්වාස කරති.
කාලයාගේ ඇවෑමෙන් මෙය තවත් ව්‍යාප්තවී අව්ලියාවරුන්, ඉමාම් වරුන්ගේ නාමයෙන්ද මව්ලිද් ලියනු ලැබීය. (උදා: මුහ්යිද්දීන්, ෂාහුල් හමීද්, බද්රුසහාබාවරු) ඒවා ෂිර්ක් ගැබ්ගත් ගීතයන් හා කෙළි උලලයන් හාටියට විශ්වාරුඪවිය.

**<u>මව්ලිද් උත්සවයන් බිහිවුනු අවධිය.</u>**

මෙම මව්ලිදයන් පළමුවරට බිහිකරණලද්දේ ෆාතිමීන්වරුන්ගේ 4වැනි (ඃහලීෆා) පාලකයාවූ හිජ්රි 365 දී මරණයට පත්වූ අල් මුඉස්සුලිදීනිල්ලා විසිනි. මොහු නබි ρ තුමන්, අලි (රළි) තුමන්හසන් (රළි) තුමන්, හුසෙය්න් (රළි) තුමන්, ෆාතිමා (රළි) තුමිය, හා වර්ථනමානයේ පාලනයේ සිටින පාලන නායකයා, යන්නන්ගේ උපන්දිනය සැමරීම හඳුන්වාදුන්නේය ෆාතිමිය්යුන් යන්නන් <u>ෂීආවරුන්ගෙන්</u> අධිමතධාරීන් වන්නෝය.
وأحسن الكلام للمطيعي صــ : ٤٥/٤٤ كتاب المواعظ والاعتبار للمقريزي ٤٩٠/١

පසුව හි: 495 වල මරණයටපත්වූ අල් මුස්තෑලී බිල්ලාහ් යන පාලකයාගේ රජසබයෙහි මහ ඇමති දූරය දැරූ අල් අෆලල් බින් අමීරුල් ජුයූෂ්යන්නා එම මව්ලිද් උත්සවයන් අත්හිතුවෙය. මොහු හි. 595 දී වියෝවිය.(كتاب المواعظ والاعتبار ٤٣٢/١ )

ජනයාගේ මතකයෙන් මැකීයන අයුරින් ටික කලක් එම උත්සවයන් ඇනසිටිය. පසුව හි: 525 වල මරණයට පත්වූ අල් ආමිර් බිඅහ්කාමිල්ලා යන කලීෆාවරයා තම මහඇමති අල්අෆ්ලල් යන්නාට එරෙහිව ක්‍රියා කරමින් මව්ලිද් උත්සවයන් නැවත පැවැත්වීමට අණකළේය.

**<u>උමර් අල් මල්ලාවන්ගේ මව්ලිද් උත්සව</u>**

හි.570 වල මරණයට පත් **උමර් අල් මල්ලා** සූෆි වාදියෙක්. මහු උතුරු ඉරාකයේ පිහිටා ඇති අල් මව්සිල් යන නගරයේ වාර්ෂිකව නබි ρ තුමන්ගේ ජන්ම දිනය සැමරීය. එම අවස්ථාවලට අල්-මව්සිල් නගරයේ කවියන් හා පඩිවරුන් සහභාගි වෙති. කවියන් වේදිකා ගතව නබි ρ තුමන්ගේ ගුණ මහිම ගයන්නෝය. كتاب الروضتين : ١٧٢/٢

**<u>මුලෆ්ෆරුද්දීන් රජවරයාගේ මව්ලිද් උත්සවයන්</u>**

හි: 630 දී මරණයට පත්වූ මුලෆ්ෆරුද්දීන් රජවරයා ප්‍රසසිද්ධ ධානපතියෙකි, එමෙන්ම සමාජ සේවයේදළැදියෙකි. නමුත් සූෆිවාදීන්ට වහල්වුවෙකි. ඔවුන්ගේ නැටුම් දිකිර්වලටද සහභාගි වන්නෙකි මේ හේතුවෙන් ඔවුන්ගේ බලපෑම මත අවුරුද්දක් පාසා නබි ρ තුමන්ගේ ජන්ම දිනය ඉතා උත්සවාකාරයෙන් සැමරුවෙය. මෙම උත්සවයට බොහෝ

ප්‍රදේශවලින් ජනයා එක්රොක් වෙනි. හිः 633 දී මරණයට පත්වූ ඉබ්නු දිහ්යා යන්නා 'අත්තන්වීර් ෆී මව්ලිදිල් බෂීරින් නදීර් යන මව්ලිද් ග්‍රන්ථය ලියා මෙම රජවරයාව නැගිකළේය. එමගින් ඔහුට දීනාර් 1000ක් ලැබුණි.

<u>**කයිරෝ නගරය ආක්‍රමණය කළ ප්‍රංශසේනාව මව්ලිදය දිරිගැන්වීම**</u>

හිः1213දී ප්‍රංශසේනාවත් කයිරෝ නහරය ආක්‍රමණය කළේය. සෙන්පති නෙපෝලියන් බොනපාර්ට් (**Napoleon Bonaparte**), සූෆි බක්රිව කැඳවා සිරිත් පරිදි මව්ලිද් නොපැවැත්වීමේ හේතුව කුමක්දැයි විමසීය, එයට බක්රි ආහාර හිඟය, බඩුමිල අධිකවීම. අපනයන තහංචි, ජනතාව අතෙහි මුදල් හිඟය වැනි එකිනොකී හේතූන්මත මෙවර මව්ලිද් උත්සවයත් නොපැවැත්විනියි පැවසීය. එයට නෙපෝලියන් අනිවාර්‍යයෙන් මව්ලිද් උත්සව සිදුකල යුතුයි පවසා ප්‍රංශමුදලින් 300ක් පිරිණැමීය. බක්රි එයට එකඟවිය, ප්‍රංහසේනාවේ බෙරවාදනයන්, කාළතුවක්කු වෙඩි ශබ්දවලටත් අතර එවර උළෙලයත් පැවැත්විනි.

ප්‍රංශසේනාවත් මව්ලිද් උත්සවයත් දිරිගැන්වීමට පිටුසසින්වූ අරමුණවුයේ. මෙම කෙළි උළෙලවල සිදුවන ආගම් විරෝධී ක්‍රියාවත්, ගැහැණු - පිරිමි දෙපාර්ශවයේ මිශ්‍රනය, හා පංචමහා පාපයන් යනාදියට මුස්ලිම් වරුන්ව බිලි කිරිමෙන් ආක්‍රමිකයින් වෙතින් ඔවුන්ගේ අවධානය වෙනතකට යොමුකිරීමයි. ( تاريخ عجائب للجبرتي ٢/٢٠١، ٢٤٩، ٣٠٦ ،)

අදවෙනතෙක් ර්පීපිතුවේ පවත්වනු ලබන මව්ලිද් උත්සවයන්හී කාමුකවැඩ සටහන්. අනාචාරයන්, අක්‍රමිකතාවයන් පිරීපැවනීම සාමානය දෙයක්හැටියට පත්ව ඇත. ඉස්ලාමීය පාලනයක් ඇතිවීමට විරුද්ධ සියළු ආන්ඩු කාලාන්තරයෙන්ම මව්ලිද් උත්සවයන් දිරිගත්වා ඇත.

<u>**මව්ලිද් උත්සවයන් සම්බන්ධ ආගමික තීන්දුව.**</u>

ජනයා විසින් සමරනු ලබන කුමන හො මව්ලිද්යක්වේවා එය අල්කුර්ආනය හා අල්හදීස් (නබිවදන්) වල දැක්මෙන් නොමනා බිද්අත්වන්නේය. එයට සාදක පහත සඳහන්වේ.

1. අල්ලාහ් තආලා හෝ ඔහුගේ දුතයානන් (මුහම්මද් ρ තුමන්) හඳුන් වාදුන් වන්දනාමානයන් මගිනුයි අල්ලාහ් නැමදිය යුත්තේ. ඉසිලාම් දහමෙගි අවසරයෙන් තොරව යමෙකු අළුතින් නැමදීමක් ඇති කළ නොහැක. 'අල්ලාහ් අනුබලනොදුන්දේ ආගමිකදේ හැටියට සම්පාදනයකිරීම සඳහා ආදේශකරුවන් ඔවුන්ට සිටීද? (අෂ්ෂූරාः21)
2. ඉස්ලාම් දහමීය අනුමතිය නොලද් අළුත් වතාවත් සියල්ල බිද්අත්ය. සියළු බිද්අතයන් නොමනා ක්‍රියාවන්ය.
ඒ ගැන සඳහන් හදීසය මෙසේ ප්‍රකාශකරයි.

අගනා වදන් අල්ලාහ්ගේ දේව ග්‍රන්ථයයි. මනහරවු ආදර්ශය නබි මුහම්මද් ρ තුමන්නේ මග පෙන්වීමයි. (ධර්මයෙගි) අළුතින් ඇතිකලදේ නොමනාදේවන්නේය. බිද්යතයෙන් සියල්ල නොමනාදේය, නොමනාදේ වල් සියල්ලටගිම් ස්ථානයතිරයය්. යනුවෙන් නබි ρ තුමන් ප්‍රකාශ කළ බව ජාබිර් බින් අබ්දුල්ලා (රළි) තුමන් දන්වා සිටී. (මුස්ලිම්ः2002, නසායිः1577)
බිද්අත් සියල්ල නොමනා ක්‍රියා යන නබිවදනින් පැහැදිලිවන්නේ බිද්අත්වල ප්‍රසන්න බිද්අත් යනුවෙන් කිසිවක් නැති බවයි. පහත සඳහන් <u>අබ්දුල්ලාහිබ්නු උමර් (රළි)</u> තුමාගේ ප්‍රකාශය මෙමකරුණ තවත් ස්ථිරිකරසිටී.
'බිද්අතයන්ව ජනයා ප්‍රසන්නයයි සිතුවද සියළු බිද්අතයන් අප්‍රසන්නයි.' ආධාරයः අස්සුන්නා - කතෘ මුහම්මද් බින් නසීර් අල්මර්වයි. හදීස්ः 83
3- බිද්අතයන්ව යහපත් චේතනාව මත ඉටුකිරීමෙන් ඒවා ප්‍රසන්න දේහැටියට පත්විය නොහැකිය.
(තමන්) කළ ක්‍රියාවල පාඩුලැබුවන් පිළිබඳව අප ඔබට දන්වාදෙන්නද? ඔවුන් වන්නේ මෙලොව දිවියෙහි තමන්ගේ උත්සාහයන් නිෂ්ඵල වුවන්ය. හෙතෙම තමන් යහපත් දේ කරනියි සිතන්නෝය. (අල්කහ්ෆ්ः104)

4- නබි ρ තුමන්නේ ජන්මදිනය සැමරීම ක්‍රිස්තියානිවරු යේසු (ඊසා υ) තුමන්නේ ජන්ම දිනය සැම රීමට සාපේක්ෂවේ. යුදෙව්වරුන්ව හෝ ක්‍රිස්තියානි වරුන්ව දැහැමි ක්‍රියාවලහෝ උත්සව දිනයන් සම්බන්ද කාර්යවලහෝ අනුගමනය කිරීම නබි මුහම්මද් ρ තුමන් වළක්වා ඇත.
'ඔබලා ඔබට පෙර විසූ අයගේ මග වියතින් වියත, රියනෙන් රියන අනුගමනය කරණු ඇත. ඔව්හු තලගොයි කුඹහක්තුලටවුද රිංගුවහොත් ඔබත් රිංගති යනුවන් නබි ρ තුමා පැවසුවිටः අල්ලාහ්ගේ දූතයානෙනි යුදෙව්වන්, කතොලිකයින් වද ඔබ අදහස්කරන්නේ? යනුවෙන් අප විමසුවිට, ඔවුන්විනා වෙනත් කව්රුන්ද? යනුවෙන් පැවසීය.' (බුඃහාරීः3456, මුස්ලිම්ः6723)

5. නබි ρ තුමන් ගැන හෝ වෙනත් උත්තමයන් ගැන හෝ ගුණ ගායනා ලියා අල්ලාහ් දෙවියන්ට වන්දනාමාන කිරීම, ගායනා, ගීත මගින් අල්ලාහ්වෙන සමීපවීමට උත්සාහ කිරීම නොමනා බිද්අත්යන්වේ. ඉස්ලාම් දහම හඳුන්වාදී තිබෙන වත් පිළිවෙත්වල ගීත. ගායනා තුලින් දෙවියන්ට වන්දනා කිරීමක් නොමැත. එය කිතු, ඉන්දු ආගම්වලට අදාල දේවල්වේ.

6. වත්මන්හි ප්‍රායෝගිකව තිබන මව්ලිද් ගීත ගායනාවල නබි ρ තුමන්ව සීමාව ඉක්මවා පැසසීම දක්නට ඇත. තවත් සමගරක් ගීතවල ෂිර්ක්, කුෆ්ර් (අල්ලාහ්ව ප්‍රතික්ෂේපකිරීම) වෙත ඇදාගන්නා වචනයන්, නබි ρ තුමන්ව අල්ලාහ් දෙවියන්ගේ තත්වෙට උසස්කොට ගැයූ වැකියන් ඉතා සුලබව දක්නට ඇත. මෙවැනිදේ (සීමාව ඉක්මවීම්) තමා විෂයෙහි වළක්වාගනුමෙන් නබි ρ තුමන් අණකරන්නේය.
ක්‍රිස්තියානුවන් මරියම්ගේ පුත් ඊසා තුමන්ව සීමාව ඉක් මවා පැසසුමෙන් ඔබලා මා නොපසසන්න. මා ඔහුගේ (අල්ලාහ්ගේ) ගැත්තා පමණි. එබැවින් අල්ලාහ්ගේ ගැත්තා හා මහුගේ දූතයායි පවසන්න. (බුඃහාරී ග්‍රන්ථය 3445)
7. ඉහත සඳහන් ධර්මාශ්‍ර තීන්දුන්ට එකගව, මව්ලිද් සභාවට සහභාගිවීම, නැතහොත් එම උත්සවයන් වෙනුවෙන් පිරිණමනු ලබන ආහාර අනුභවකිරීම සහා මව්ලූද් කියවා (දෙසා) මුදල් ඉපයීම, මේ සියල්ල තහනම් (හරාම්) කරුණුවේ. අල්ලාහ් දෙවියන්ගේ දඩුවමට භාජනය කරවන වැරදීන්ය.

**සැකසුමः** **සිංහලෙන්ः**

ආචාර්ය, යූ.එල්. අහ්මද් අෂ්රෆ්
සභාපති - දාරුල් හදීද් කොළඹ
සහාය කතිකාචාර්ය කින්ක් හාලිද් විශ්ව විද්‍යාලය.

එ.එච්.ළෆරුල්ලාහ්
කැඳවීමේ හා මඟපෙන් වීමේ සහසේගී කාර්යාලය,
උතුරු රියාද්